# සිගාලෝවාද (සිගාල/සිගාලක) සූත්‍රය

(දී.නි. iii, 288-310 පිටු, බුජත්‍රි.)

ක්‍රි. පූ. 6 වන සියවසෙහි භාරතයෙහි පහළ වූ බුදුරාජාණන් වහන්සේ පුරා වසර 45ක් ලොවට දම් දෙසූහ. එහිදී භික්ෂු - භික්ෂුණී - උපාසක - උපාසිකා යන සිව්වන පිරිස උන්වහන්සේගේ ප්‍රධාන ශ්‍රාවකයෝ වූහ. බුදුරදුන්ගේ බොහෝ දේශනා මෙම සිව්වන පිරිස ම ඉලක්ක කොට දේශනා කළ ඒවා ය. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය (අං.නි. v, 234 පිට), සිගාලක සූත්‍රය (දී.නි. iii, 288 පිට), ධම්මික සූත්‍රය (සු.නි. 112), වසල සූත්‍රය (සු.නි. 44 පිට), පරාභව සූත්‍රය (සු.නි. 36 පිට), අනාථපිණ්ඩිකෝවාද සූත්‍රය ආදී දේශනා විශේෂයෙන් ගිහි උපාසික - උපාසිකාවන් ඉලක්ක කොට දෙසන ලද සූත්‍රයි. ඒ අතර දීඝනිකායේ ඇතුළත් සිගාලක සූත්‍රය ගෘහස්ථ ජීවිතයේ පිරිහීමට තුඩුදෙන කරුණු මෙන් ම මිතුරන් හඳුනාගැනීමට අදාළ කරුණු මගින් ජීවිතයේ අයහපත බැහැර කොට ජීවිත සඵල කර ගැනීමට අදාළ කරුණු රැසක් ඉදිරිපත් කරයි. එහි සඳහන් උපදෙස් මගින් ගෘහස්ථ ජීවිතය නිසි මාවතට යොමු කර ගැනීමට නුවණැති ශ්‍රාවකයාට අවකාශ සැලසේ.

බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වෙළුවනාරාමයෙහි කලන්දකනිවාපයෙහි වැඩ වෙසෙන සම යෙහි දිනක් අළුයම සිගාලක නම් ගෘහපතියා රජගහ නුවරින් නික්ම තෙත් දියකඩින් හා හිසකෙසින් යුක්ත ව සදිසාවන්ට නමස්කාර කරමින් සිටියේ ය. මේ අතර බුදුරජාණන් වහන්සේ පෙරවරුවෙහි පිණ්ඩපාතයෙහි වැඩම කරන විට සදිසාවන් නමස්කාර කරන සිගාලක මුණගැසුණි. එහි දී උන් වහන්සේ සිගාලක කුමකට වඳින්නේ දැයි ප්‍රශ්න කළහ. තම පියා මිය යන විට සදිසාවන්ට නමස්කාර කරන ලෙස අවවාද දුන් බවත් පියාගේ එම වචනය ගරු කිරීම සඳහා තමා නැගෙනහිර, දකුණ, බටහිර, උතුර, යට, උඩ යන සදිසාවන්ට නමස්කාර කරන බවත් සිගාලක බුදුරදුන්ට පිළිතුරු දුන්නේ ය.

මෙහි දී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ ආර්ය විනයෙහි සදිසා නමස්කාරය මෙසේ නොවන බවයි. එවිට සිගාලක ආර්ය විනයෙහි සදිසා නමස්කාරය කෙසේ ද යන්න බුදුරදුන් වෙතින් ප්‍රශ්න කළේ ය. එසේ නම් මනාකොට අසන්න, මෙනෙහි කරන්න යැයි පවසා භාග්‍යවතුන් වහන්සේ එම කරුණු දේශනා කළහ. අනතුරුව සදිසාවන් විස්තර කිරීමට ප්‍රථම ආරම්භයෙහි සදිසාවන් වසාලන චුද්දස (14) ලාමක කර්ම විස්තර කරති. එනම් සතර කර්ම ක්ලේශ, සතර අගති හා අපායමුඛ හය යන දාහතරයි.

## ● සතර කර්ම ක්ලේශ :-

1. ප්‍රාණඝාතය 2. සොරකම
3. බොරුකීම 4. පරදාර සේවනය

ප්‍රාණඝාතය යනු දන දන අන් සතකුගේ දිවි තොර කිරීමයි. අනුන් අයත් දෑ සොරසිතින් ගැනීම අදින්නාදාන හෙවත් සොරකමයි. අන් අය රටවන මුලා කරවන අදහසින් තම වචන හෝ චර්යා භාවිත කිරීම මුසාවාදයයි. පරදාර යනු අනුන් සතු අඹුවන් සම්මතය ඉක්මවා තම සිතැඟි ඉටුකර ගැනීමට භාවිත කිරීමයි. මේවා පුද්ගලයකුගේ යහපත නසන සිත කිලිටි කරවන පාපයට ඇද දමන දුගතියට පමුණුවන කරුණුයි.

*පාණාතිපාතං අදින්නාදානං මුසාවාදො ච වුච්චති,*
*පරදාරගමනඤ්චෙව නප්පසංසන්ති පණ්ඩිතා.*

## ● සතර අගති :-

1. ඡන්ද 2. දෝස
3. භය 4. මෝහ

කැමැත්ත නිසා හෝ ද්වේෂය නිසා හෝ බිය නිසා හෝ මෝඩකම නිසා හෝ තීරණ තීන්දු ගැනීමේදී අගතිගාමී ව කිරීම මෙයින් දක්වේ. ඡන්දය වරදක් වන්නේ එය මිථ්‍යාදෘෂ්ටිය මත පිහිටා සිදු කරන විටයි. මෙම කරුණු මගින් තමාටත් අනුන්ටත් මෙලොවටත් පරලොවටත් අනර්ථයක් අවැඩක් සිදු වේ.

*ඡන්දා දොසා භයා මොහා යො ධම්මං අතිවත්තති,*
*නිහීයති තස්ස යසො කාළපක්ඛෙ'ව චන්දිමා.*

- **අපාය මුඛ හය ෘ-**

හෝගයන්ගේ විනාශයට හේතුවන කරුණු හයක් මෙමඟින් විස්තර වේ.

1. රහමෙර පානය
   *(සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගො ඛො ගහපතිපුත්ත භොගානං අපායමුඛං)*
2. නොකල්හි වීථි සංචාරය
   *(විකාලවිසිඛාචරියානුයොගො භොගානං අපායමුඛං)*
3. උත්සව බැලීමට /දැකීමට යාම
   *(සමජ්ජාභිචරණං භොගානං අපායමුඛං)*
4. දූ කෙළියෙහි යෙදීම
   *(ජූතප්පමාදට්ඨානානුයොගො භොගානං අපායමුඛං)*
5. පාපමිතුරන් හා එක්වීම
   *(පාපමිත්තානුයොගො භොගානං අපායමුඛං)*
6. අලසබව
   *(ආලස්සානුයොගො භොගානං අපායමුඛං)*

මෙකී ලාමක ධර්ම දාහතරින් අතමිදී සදිසාවන් නමස්කාර කිරීමෙන් මෙලොව ද සතුටු ව පරලොව ද සතුටු ව මරණින් මතු මනාප ගති ඇති ස්වර්ග ලෝකයට පැමිණෙන බව දේශනා කරති.

ඉන්පසු ඉහත සඳහන් කරුණු දාහතර තවදුරටත් විස්තර කෙරේ.

1. රහමෙරපානයෙහි දෝෂ හයකි.

එනම්,

i. මෙලොවදී ම ධනහානිය (*සන්දිට්ඨිකා ධනජානි*)
ii. කලහ වැඩිවීම (*කලහප්පවඩ්ඪනි*)
iii.රෝගාදිය හටගැනීම (*රොගානං ආයතනං*)
iv.අපකීර්තිය පැතිරීම (*අකිත්තිසඤ්ජනනී*)
v. ලැජ්ජාව නැතිවීම (*කොපීනනිදංසනී*)
vi. නුවණ දුබලවීම (*පඤ්ඤාය දුබ්බලීකරණීති*)

2. නොකල්හි වීථි සංචාරයෙහි දෝෂ 6 කි.

එනම්,

i. තමා ආරක්ෂා රහිත වීම (*අත්තාපිස්ස අගුත්තො අරක්ඛිතො හොති*)
ii. තම අඹු දරුවන් ආරක්ෂා රහිත වීම (*පුත්තදාරොපිස්ස අගුත්තා අරක්ඛිතා හොති*)
iii.ධනය ආරක්ෂා රහිත වීම (*සාපතෙය්‍යම්පිස්ස අගුත්තං අරක්ඛිතං හොති*)
iv. සැක කළයුතු පුද්ගලයකු වීම (*සඞ්කියො ච හොති පාපකෙසු ඨානෙසු*)
v. අභූත චෝදනා පැමිණීම (*අභූතවචනං ච තස්මිං රූහති*)
vi. බොහෝ කරදරවලට මුහුණපෑම (*බහූනඤ්ච දුක්ඛධම්මානං පුරක්ඛතො හොති*)

3. උත්සව බැලීමට යාමෙහි ආදීනව 6 කි.

එනම්,

i. නෘත්‍ය කොතැන ද (*ක්ව නච්චං*)
ii. ගීත ගායනා කොතැන ද (*ක්ව ගීතං*)
iii.බෙර ආදී වාදන කොතැන ද (*ක්ව වාදිතං*)
iv.මහාභාරත ආදී කථා කොතැන ද (*ක්ව අක්ඛානං*)
v. අත්තාලම ක්‍රීඩා කොතැන ද (*ක්ව පාණිස්සරං*)
vi. කළ පිඟීම් ක්‍රීඩා කොතැන ද (*ක්ව කුම්භථූණං*)

ආදී වශයෙන් සොයමින් ඇවිදීමට (*සමජ්ජාභිචරණෙ*) සිදුවීම

4. දාදු ක්‍රීඩාවෙහි (දූ කෙළියෙහි) ආදීනව 6 කි.
   එනම්,
   i. සූදුවෙන් දිනූ කල්හි සතුරන් ඇතිවීම (*ජයං වෙරං පසවති*)
   ii. පැරදුණු කල්හි වස්තුව අනුව දුක්වීම (*ජිනො විත්තමනුසොචති*)
   iii.ඇස් අභිමුව දී ම ධනය පිරිහීය (*සන්දිට්ඨිකා ධනජානි*)
   iv.සමාජයේ දී ඔහුගේ වචන නොපිළිගැනීම (*සභාගතස්ස වචනං න රූහති*)
   v. මිත්‍රාමාත්‍යාදීන්ගෙන් අවඥා ලැබීම (*මිත්තාමච්චානං පරිභූතො හොති*)
   vi. දූ කෙළියෙහි යෙදුණු මේ පුරුෂයා කෙසේ අඹුදරුවන් රක්නේ දැයි ආවාහ විවාහ වීමට කිසිවකු කැමැති නොවීම (*ආවාහවිවාහකානං අපත්ථිතො හොති*)

5. පාපමිත්‍ර ඇසුරෙහි ආදීනව 6 කි.
   එනම්,
   i. සූදුකාරයන් තම ඇසුරට පැමිණීම (*යෙ ධූත්තා ත්‍යාස්ස මිත්තා හොන්ති*)
   ii. සල්ලාලයන් තම ඇසුරට පැමිණීම (*යෙ සොණ්ඩා*)
   iii.බේබද්දන් තම ඇසුරට පැමිණීම (*යෙ පිපාසා*)
   iv.බොරු රන් ආදිය දී රවටන්නන් (නෙකතිකයන්) තම ඇසුරට පැමිණීම (*යෙ නෙකතිකා*)
   v.වංචනිකයන් තම ඇසුරට පැමිණීම (*යෙ වඤ්චනිකා*)
   vi.සාහසිකයන් තම ඇසුරට පැමිණීම (*යෙ සාහසිකා*)

6. අලසබවෙහි ආදීනව 6 කි.
   එනම්,
   i. ඉතා ශීත යැයි කටයුතුවල නොයෙදීම (*අතිසීතන්ති කම්මං න කරොති*)
   ii. ඉතා උෂ්ණ යැයි කටයුතුවල නොයෙදීම (*අතිඋණ්හන්ති කම්මං න කරොති*)
   iii.ඉතා සවස යැයි කටයුතුවල නොයෙදීම (*අතිසායන්ති කම්මං න කරොති*)
   iv.ඉතා උදෑසන යැයි කටයුතුවල නොයෙදීම (*අතිපාතො'ති කම්මං න කරෙති*)
   v.ඉතා බඩගිනියැයි කටයුතුවල නොයෙදීම (*අතිජාතො'ස්මීති*)
   vi.ඉතා කුස පිරුණේ යැයි කටයුතුවල නොයෙදීම (*අතිධාතො'ස්මීති*)

මෙලෙස අලස ව සිටින්නන්ගේ නූපන් භෝග නූපදින අතර උපන් භෝග විනාශයට යෙයි.

## මිත්‍ර ප්‍රතිරූපකයෝ

මිතුරන් සේ පෙනී සිටින එහෙත් අවංක මිතුරන් නොවන (මිත්‍ර ප්‍රතිරූපක) පුද්ගලයන් සිව් දෙනෙකි.
   එනම්,
   1. අඤ්ඤදත්ථුහර (මිතුරා සතු දෑ රැගෙන යන)
   2. වචීපරම (වචනයෙන් පමණක් උපකාර කරන)
   3. අනුප්පියභාණී (චාටු බස් කතා කරන)
   4. අපායසහාය (අපාගත වීමට සහාය වන)

1. අඤ්ඤදත්ථුහර නම් මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ 4 කි.
   එනම්,
   i. කෙසේ හෝ යමක් රැගෙන යයි.
   ii. ටිකක් දී බොහෝ දෑ ගෙන යාමට කැමැති වෙයි.
   iii.තමාට බියක් විපතක් ඇති කල්හි ඇසුරු කරයි.
   iv.තම වාසිය සඳහා ඇසුරු කෙරෙයි.

*අඤ්ඤදත්ථුහරො හොති අප්පෙන බහුමිච්ඡති,*
*භයස්ස කිච්චං කරොති සෙවති අත්ථකාරණා.*
*අඤ්ඤදත්ථුහරො හොති අප්පෙන බහුමිච්ඡති,*
*භයස්ස කිච්චං කරොති සෙවති අත්ථකාරණා.*

2. වචීපරම නම් මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ 4 කි.
එනම්,
i. අතීතයෙන් සංග්‍රහ කරයි (*අතීතෙන පටිසන්ථරති*).
ii. අනාගතයෙන් සංග්‍රහ කරයි (*අනාගතෙන පටිසන්ථරති*).
iii.හිස් දෙයින් සංග්‍රහ කරයි (*නිරත්ථකෙන සඞ්ගණ්හාති*).
iv.කටයුත්තක් පැමිණි කල්හි එහි බිය දකියි (*පච්චුප්පන්නෙසු කිච්චෙසු බ්‍යාසනං දස්සෙති*).
වැඩකට නැති වචනයෙන් පමණක් සංග්‍රහ කරන වචීපරම මිතුරා මෙලෙස දත යුතුය.

3. අනුප්පියභාණී නම් මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ 4 කි.
එනම්,
i. හොඳ දෙය ද අනුමත කරයි (*පාපකම්පි'ස්ස අනුජානාති*).
ii. නරක දෙය ද අනුමත කරයි (*කල්‍යාණම්පි'ස්ස අනුජානාති*).
iii.ඇති තැන ගුණ කියයි (*සම්මුඛා'ස්ස වණ්ණං භාසති*).
iv.නැති තැන දොස් කියයි (*පරම්මුඛා'ස්ස අවණ්ණං භාසති*).

4. අපායසහාය නම් මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ 4 කි.
එනම්,
i. රහමෙර පානයෙහි සහාය වෙයි (*සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ සහායො හොති).*
ii. නොකල්හි වීථි සංචරණයෙහි සහාය වෙයි (*විකාලවිසිඛාචරියානුයොගෙ සහායො හොති*).
iii.නෘත්‍ය දර්ශනයෙහි සහාය වෙයි (*සමජ්ජාභිචරණෙ සහායො හොති*).
iv.දූ කෙළියෙහි සහාය වෙයි (*ජූතප්පමාදට්ඨානානුයොගෙ සහායො හොති).*

මිතුරු වෙසින් පෙනී සිටින මෙබඳු අමිත්‍රයන් උවදුරු සහිත බිය ගෙන දෙන මාර්ගයක් සේ සලකා දුරින් ම බැහැර කළ යුතු ය.

*අඤ්ඤදත්ථුහරො මිත්තො යො ච මිත්තො වචීපරො,*
*අනුප්පියඤ්ච යො ආහ අපායෙසු ච යො සඛා.*
*එතෙ අමිත්තෙ චත්තාරො ඉති විඤ්ඤාය පණ්ඩිතො,*
*ආරකා පරිවජ්ජෙය්‍ය මග්ගං පටිභයං යථා'ති.*

## සුහද මිත්‍රයෝ

හොඳ හදවත් ඇති (සුහද) ඇසුරු කළ යුතු යහපත් / කලණ මිතුරන් සිව් දෙනෙකි.
එනම්,
1. උපකාරක මිතුරා
2. සමානසුඛදුක්ඛ මිතුරා
3. අත්ථක්ඛායී මිතුරා
4. අනුකම්පක මිතුරා

1. උපකාරක මිතුරාගේ ලක්ෂණ 4 කි.
එනම්,
i. ප්‍රමාද වූවන් රකියි (*පමත්තං රක්ඛති*).
ii. ප්‍රමාද වූ මිතුරාගේ වස්තුව රකියි (*පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛති*).
iii.බියට පත්වූවන්ට පිහිට වෙයි (*භීතස්ස සරණං හොති*).
iv.කටයුතු උපන් කල වැඩියෙන් ධනය දෙයි (*උප්පන්නෙ කිච්චකරණීයෙ තද්දිගුණං භොගං අනුප්පදෙති*).

2. සමානසුඛදුක්ඛ මිතුරාගේ ලක්ෂණ 4 කි.

එනම්,

i. රහස් කියයි (*ගුය්හමස්ස ආචික්ඛති*).
ii. රහස් රකියි (*ගුය්හමස්ස පරිගුහති*).
iii.විපතෙහි අත් නොහරියි (*ආපදාසු න විජහති*).
iv.කරුණක් ඇති කල්හි ජීවිත වුවද පුදයි (*ජීවිතම්පි'ස්ස අත්ථාය පරිච්චත්තං හොති*).

3. අත්ථක්ඛායී මිතුරාගේ ලක්ෂණ 4 කි.

එනම්,

i. පවින් වළකයි (*පාපා නිවාරෙති*).
ii. යහපතෙහි පිහිටුවයි (*කල්‍යාණෙ නිවෙසෙති).*
iii.නොදත් දේ කියයි (*අස්සුතං සාවෙති*).
iv.සුගතියට මග කියා දෙයි (*සග්ගස්ස මග්ගං ආචික්ඛති*).

4. අනුකම්පක මිතුරාගේ ලක්ෂණ 4 කි.

එනම්,

i. තම මිතුරාගේ පිරිහීමෙහි දී සතුටු නොවෙයි (*අභවෙනස්ස න නන්දති*).
ii. තම මිතුරාගේ අභිවෘද්ධියෙහි දී සතුටු වෙයි (*භවෙනස්ස නන්දති*).
iii.තම මිතුරා පිළිබඳ දොස් කියන්නවුන් ඉන් වළකයි (අවණ්ණං භණමානං නිවාරෙති).
iv. තම මිතුරා පිළිබඳ ගුණ කියන්නවුන් පසසයි (*වණ්ණං භණමානං පසංසති).*

හොඳ හදවත් ඇති තමාට යහපත සිදුකරන මෙබඳු සුහද මිතුරන් මව තම පුතුන් ළෙහි දා රකින්නාක් මෙන් සත්කාර කොට ඇසුරු කළ යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කරති.

*උපකාරො ච යො මිත්තො යො ච මිත්තො සුඛෙ දුඛෙ,*
*අත්ථක්ඛායී ච යො මිත්තො යො ච මිත්තො'නුකම්පිකො.*
*එතෙ පි මිත්තෙ චත්තාරො ඉති විඤ්ඤාය පණ්ඩිතො,*
*සක්කච්චං පයිරුපාසෙයය්‍ය මාතා පුත්තං'ව ඕරසං*

පාප මිතුරන් බැහැර කොට සුහද මිතුරන් ඇසුරු කරමින් කටයුතු කරන ගිහියකු තම ධනය පිළිබඳ ව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව ද මෙහි සඳහන් වේ. ඒ අනුව තමා උපයන ධනය කොටස් හතරකට බෙදා ඉන් එක් කොටසක් පරිභෝජනය සඳහා ද දෙකොටසක් තම වෘත්තියෙහි අභිවෘද්ධිය සඳහා ද ඉතිරි කොටස විපතක් පැමිණි කල්හි ප්‍රයෝජනය පිණිස ඉතිරිකිරීම සඳහා ද යෙදවිය යුතු බව දක්වේ.

*එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය ද්වීහි කම්මං පයොජයෙ,*
*චතුත්ථඤ්ච නිධාපෙය්‍ය ආපදාසු භවිස්සති.*

ඉන් අනතුරුව බුදුසසුනෙහි දක්වෙන සදිසා වන්දනාව කෙබඳු දැයි බුදුරජාණන් වහන්සේ සිගාල තරුණයාට පැහැදිලි කරති. සමාජයේ වෙසෙන සැවොම කොටස් හයකට බෙදා ඔවුන් දිසාවන් හයට ආදේශ කොට ඔවුන් විසින් අන්‍යොන්‍ය වශයෙන් කළයුතු යුතුකම් මෙහි දී විස්තර කොට ඇත. මෙහි ඇති විශේෂත්වය වන්නේ සමාජයේ සෑම ස්තරයක ම සිටින්නවුන් විසින් තමන්ට නියමිත යුතුකම නොහොත් වගකීම මැනැවින් හඳුනාගෙන එය ඉටු කිරීමයි. යමෙක් තම වගකීම් නිසි ලෙස ඉටු කරන විට එය අනෙකාගේ අයිතිවාසිකමක් බවට පත් වේ. බුදුදහමට අනුව අයිතිවාසිකම් යනු සටන් කොට ලබා ගන්නක් නොව අනෙකා විසින් තම කැමැත්තෙන් වගකීමක් නොහොත් යුතුකම් ලෙස ඉටු කරනු ලබන්නක් වේ. යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ බුදුසමයෙන් නිර්දේශිත මෙම උපදේශනය බෙහෙවින් වැදගත් මෙන් ම ශිෂ්ට සම්මත වූවකි. මෙම ක්‍රමය ලොව බොහෝ මැදහත් වියතුන්ගේ සම්භාවනාවට පාත්‍ර වී තිබේ.

*මාතාපිතා දිසා පුබ්බා ආචරියා දක්ඛිණා දිසා,*
*පුත්තදාරා දිසා පච්ඡා මිත්තාමච්චා ච උත්තරා.*
*දාසකම්මකරා හෙට්ඨා උද්ධං සමණබ්‍රාහ්මණා,*
*එතා දිසා නමස්සෙය්‍ය අලමත්තො කුලෙ ගිහී.*

බුදුරදුන් සිගාල ගෘහපතියාට වදාළ සදිසාවන් මෙම ගාථාවලින් දක්වේ.

ඒ අනුව,

| | | |
|---|---|---|
| 1. නැගෙනහිර (පෙරදිග) | - | දෙමව්පියන් |
| 2. දකුණු දිග | - | ගුරුවරුන් |
| 3. බටහිර දිග | - | අඹුදරුවන් |
| 4. උතුරු දිග | - | මිතුරන් |
| 5. යට දිග | - | දැසිදස්සන් |
| 6. උඩ දිග | - | මහණ බමුණන් |

1. නැගෙනහිර හෙවත් පෙරදිග නම් වූ දෙමාපියන් කෙරෙහි දරුවන් විසින් පිළිපැදිය යුතු කරුණු 5කි.

එනම්,

i. ආහාරපානයෙන් පෝෂණය කරන්නෙමි (*භතො නෙසං භරිස්සාමි*).

ii. ඔවුන්ගේ කටයුතු කර දෙන්නෙමි (*කිච්චං නෙසං කරිස්සාමි*).

iii.කුලවංශය රකින්නෙමි (*කුලවංසං ඨපෙස්සාමි*).

iv.දායාද ආරක්ෂා කරමි(*දායජ්ජං පටිපජ්ජාමි*).

v.මාපියන් මියගිය කල්හි දක්ෂිණා සිදුකොට පින් අනුමෝදන් කරවන්නෙමි (*අථ වා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සාමි*).

● මෙලෙස දෙමාපියන් සංග්‍රහ ලැබීමට කරුණු පහකින් ඔවුන් විසින් ද කරුණු පහකින් තම දරුවන්ට සංග්‍රහ කොට තිබිය යුතු ය.

එනම්,

i. දරුවන් පවින් වළක්වති (*පාපා නිවාරෙන්ති).*

ii.යහපතෙහි යොදවති (*කල්‍යාණෙ නිවෙසෙන්ති).*

iii.අධ්‍යාපනය / ශිල්ප ලබා දෙති *(සිප්පං සික්ඛාපෙන්ති).*

iv.සුදුසු දැරියන් හා ආවාහ කෙරෙති *(පතිරූපෙන දාරෙන සංයොජෙන්ති).*

v.සුදුසු කල්හි දායාද පවරා දෙති *(සමයෙ දායජ්ජං නීයාදෙන්ති).*

දෙමාපිය දූදරුවන් වශයෙන් ඔවුනොවුන් අන්‍යොන්‍ය වශයෙන් සිය යුතුකම් ඉටු කරන කල පෙරදිග පුදන ලද්දේ වෙයි. උපද්‍රව රහිත වූයේ ක්ෂේම වූයේ ද වේ.

2. දකුණු දිග නම් වූ ගුරුවරුන් කෙරෙහි අතවැසියන් විසින් පිළිපැදිය යුතු කරුණු 5කි.

එනම්,

i.ගුරුවරුන් දුටු විට හුනස්නෙන් නැගිටීමෙන් (*උට්ඨානෙන*)

ii.උපස්ථාන කිරීමෙන් (*උපට්ඨානෙන*)

iii.ගුරුවරුන්ගේ බසට ඇහුන්කන් දීමෙන් (*සුස්සූසාය*)

iv.වතාවත් කිරීමෙන් (*පාරිචරියාය*)

v.උගන්වන ශිල්පය මැනැවින් ඉගෙනීමෙන් (*සක්කච්චං සිප්පපටිග්ගහණෙන*)

● මෙම කරුණු පහෙන් පිදෙන ගුරුවරයා සිය අතවැසියන්ට කරුණු 5 කින් සංග්‍රහ කළ යුතුය.

එනම්,

i. මනාකොට හික්මවති *(සුවිනීතං විනෙන්ති).*

ii. මනාකොට උගන්වති (*සුග්ගහිතං ගාහාපෙන්ති).*

iii.සියලු ශිල්පශාස්ත්‍ර ගුරුමුෂ්ටි රහිත ව උගන්වති (*සබ්බසිප්පසුතං සමක්ඛායිනො භවන්ති).*

iv.මිත්‍රාමාත්‍යාදීන්ට හඳුන්වා දෙති (*මිත්තාමච්චෙසු පටියාදෙන්ති).*

v. දිශාවන්හි ආරක්ෂාව සලස්වති. (*දිසාසු පරිත්තානං කරොන්ති).*

ගුරුවරුන් හා අතවැසියන් සිය වගකීම මැනැවින් තේරුම් ගෙන තමාට අදාළ කරුණුවලින් ඔවුනොවුන් සංග්‍රහ කර ගන්නා කල්හි දකුණු දෙස උපද්‍රව රහිත වූයේ බිය රහිත වූයේ සුරක්ෂිත වූයේ වෙයි.

3. පශ්චිම හෙවත් බටහිර දිග නම් වූ භාර්යාවන් කෙරෙහි ස්වාමිවරුන් විසින් පිළිපැදිය යුතු කරුණු 5කි.

එනම්,

i. ගරු කිරීමෙන් (*සම්මානනාය*)
ii. අවමන් නොකිරීමෙන් (*අනවමානනාය*)
iii. භාර්යාවන් නොඉක්මවීමෙන් (*අනතිචරියාය*)
iv. ඓශ්වර්ය පැවරීමෙන් (*ඉස්සරියවොස්සග්ගෙන*)
v. ආභරණ ගෙනදීමෙන් (*අලංකාරානුප්පදානෙන*)

- මෙම කරුණුවලින් සංග්‍රහ ලබන භාර්යාවන් සිය ස්වාමියන් වෙත කරුණු 5කින් පිළිපැදිය යුතුය.

එනම්,

i. කටයුතු මැනැවින් සංවිධානය කරයි (*සුසංවිහිතකම්මන්තා ච හොති).*
ii. පිරිවර ජනයාට මැනැවින් සංග්‍රහ කරයි (*සුසංගහිතපරිජනා ච).*
iii. නො ඉක්මවා යයි (*අනතිචාරිනී ච).*
iv. රැස්කළ දේ රකියි (*සම්භතං අනුරක්ඛති).*
v. කුඩු මහත් කටයුතුවල දක්ෂ ද අනලස් ද වෙයි (*දක්ඛා ච හොති අනලසා සබ්බකිච්චෙසු*).

4. උතුරු දිශාව නම් වූ මිත්‍ර ජනයන් වෙත කුලපුත්‍රයන් විසින් කරුණු 5කින් පිළිපැදිය යුතුය.

එනම්,

i. පරිත්‍යාගයෙන් (*දානෙන*)
ii. ප්‍රියවචනයෙන් (*පෙය්‍යවජ්ජෙන*)
iii. අර්ථචර්යාවෙන් (*අත්ථචරියාය*)
iv. සමානාත්මතාවෙන් (*සමානත්තතාය*)
v. නොරැවටීමෙන් (*අවිසංවාදනතාය)*

- මෙලෙස උපකාර ලබන ඔහු කරුණු 5කින් කුලපුත්‍රයාට අනුකම්පා කළ යුතු ය.

එනම්,

i. පමා වූ මිතුරාව රකිති (*පමත්තං රක්ඛන්ති).*
ii. පමා වූ මිතුරාගේ වස්තු රකිති (*පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛන්ති).*
iii. බියට පැමිණියහුට පිහිට වෙති (*භීතස්ස සරණං හොන්ති).*
iv. විපත්වලදී පිටුනොපාති (*ආපදාසු න විජහන්ති).*
v. ඔහුගේ මව්පිය අඹුදරුවන් වෙත ගෞරවයෙන් පිළිපදිති (*අපරපජා චස්ස පටිපූජෙන්ති).*

මෙලෙස ස්වාමි භාර්යාවන් සිය යුතුකම් මැනැවින් ඉටු කරන්නා කල්හි පශ්චිම දිශාව උපද්‍රව රහිත වූයේ බිය රහිත වූයේ සුරක්ෂිත වූයේ ද වෙයි.

5. යටදිශාව නම් වූ දැසිකම්කරුවන් කෙරෙහි ස්වාමියා විසින් කරුණු 5කින් පිළිපැදිය යුතු ය.

එනම්,

i. සුදුසු ලෙස කර්මාන්ත සංවිධානයෙන් (*යථාබලං කම්මන්තසංවිධානෙන*)
ii. බත්වැටුප් දීමෙන් (*භත්තවෙතනානුප්පදානෙන*)
iii. ගිලන් වූ කල උවටැන් කිරීමෙන් (*ගිලානුපට්ඨානෙන*)
iv. රස බොජුන් පිරිනැමීමෙන් (*අච්ඡරියානං රසානං සංවිභාගෙන*)
v. සුදුසු කල කර්මාන්ත පැවරීමෙන් (*සමයෙ වොස්සග්ගෙන*)

- මෙලෙස උපස්ථාපිත දැසිකම්කරුවන් විසින් සිය ස්වාමියා වෙත කරුණු 5කින් අනුග්‍රහ කළ යුතු ය.

එනම්,

i. පළමු ව නැඟිටිති (*පුබ්බුට්ඨායිනො ච හොන්ති*).
ii. පසුව නිදාගැනීමෙන් (*පච්ඡානිපාතිනො ච).*
iii. දුන් දේ ගනිති (*දින්නා දායිනො ච*).
iv. කටයුතු සැලකිලිමත් ව කරති (*සුකතකම්මකාරා ච*).
v. ගුණ කියති (*කිත්තිවණ්ණහරා ච*).

ස්වාමියන් හා දාසිකම්කරුවන් මෙලෙස සිය යුතුකම් ඉටු කරගන්නා කල යටදිශාව උපද්‍රව රහිත වූයේ බිය රහිත වූයේ සුරක්ෂිත වූයේ ද වෙයි.

6. උඩ දිශාව නම් වූ මහණ බමුණන් කෙරෙහි දායකාරකාදීන් 5කින් පිළිපැදිය යුතු ය.
එනම්,

i. මෛත්‍රී සහගත කාය කර්මයෙන් (*මෙත්තෙන කායකම්මෙන*)
ii. මෛත්‍රී සහගත වාක් කර්මයෙන් (*මෙත්තෙන වචීකම්මෙන*)
iii. මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් (*මෙත්තෙන මනොකම්මෙන*)
iv. මහණ බමුණන් උදෙසා තම නිවස විවෘත ව තැබීමෙන් (*අනාවට්ටද්වාරතාය*)
v. ගෞරව සහගත ආමිස දානයෙන් (*ආමිසානුප්පදානෙන*)

- මෙලෙස පිදුම් ලබන මහණ බමුණන් විසින් කුල පුත්‍රයන්ට කරුණු 5කින් අනුකම්පා කළ යුතු ය.
එනම්,

i. පවින් වළකති (*පාපා නිවාරෙන්ති).*
ii. යහපතෙහි යොදවති (*කල්‍යාණෙ නිවෙසෙන්ති).*
iii. යහපත් සිතින් ආශීර්වාද කරති (*කල්‍යාණෙන මනසා අනුකම්පන්ති).*
iv. නොදත් දේ කියාදෙති (*අස්සුතං සාවෙන්ති).*
v. දත් දේ මැනැවින් ප්‍රගුණ කරවති (*සුතං පරියොදපෙන්ති).*
vi. සුගතිගාමී මග කියා දෙති (*සග්ගස්ස මග්ගං ආචික්ඛන්ති).*

උඩ දිශාව නම් වූ මහණ බමුණන් කුල පුත්‍රයන් හා අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකරගන්නා කල්හි උඩදිශාව උපද්‍රව රහිත වූයේ, බිය රහිත වූයේ සුරක්ෂිත වූයේ ද වෙයි.

සමාජයේ විවිධ ස්තරයන්හි සිටින අය ඔවුනොවුන් වෙත යුතුකම් ඉටුකර ගැනීම් වශයෙන් අර්ථවත් ලෙස දිසා නමස්කාරය සිදු කරන ආකාරය පිළිබඳ බුදුරදුන්ගේ අනුශාසනාවට ඇහුම්කන් දුන් සිගාලක තරුණයා බෙහෙවින් සතුටට පත් විය. හුදෙක් කායික වශයෙන් සදිසාවන් වැඳීම නොව මෙලෙස ප්‍රායෝගික ලෙස යුතුකම් ඉටුවන අයුරින් සිදුවන දිසා වන්දනය පිළිබඳ ව සිගාලක තරුණයා බුදුරජාණන් වහන්සේට තම ප්‍රසාදය පළ කළේ ය. අවසානයෙහි ඔහු දිවි හිමියෙන් තෙරුවන් සරණ ගිය උපාසකයකු බවට පත් විය.

මෙලෙස සතර අගති, සතර කර්ම ක්ලේශ, අපාය මුඛ හය, මිත්‍ර ප්‍රතිරූපකයන්ගේ හා සුහද මිතුරන්ගේ ලක්ෂණ, ධනය යෙදවිය යුතු ආකාරය, සදිසා වන්දනාව, සමාජයේ විවිධ ස්තරවල සිටින අය විසින් සිදුකළ යුතු යුතුකම් ආදිය ඇතුළත් මෙම සූත්‍රය ගෘහස්ථ ජීවිත ගතකරන්නෙකුට බෙහෙවින් ප්‍රයෝජනවත් වන ඉගැන්වීම් ඇතුළත් සූත්‍රයක් ලෙස අගය කළ හැකි ය.